වත්තල ප්‍රාදේශීය සභාව
ගම්පහ දිස්ත්‍රික්කය

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 16 දිනද යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වත්තල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන තොග සත්‍යාක්ෂණ වාර්තාව අනුව රු.6,765,400 ක් වූ පොදු ගබඩාතොගය මූල්‍ය ප්‍රකාශනවල රු.7,218,352 ක් ලෙස දැක්වීමෙන් රු.452,952 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | සත්‍යාක්ෂණ තොග වටිනාකම ගිණුම්වලට ගැලපීම කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | මෝටර් රථ හා කරත්ත ගිණුම රු.8,226,000 ක් අඩුවෙන් පෙන්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම් ගත කළ යුතු වේ. | මීට පෙර පළාත් පාලන ආයතන සඳහා කැබ්රථ ලබා දුන් අවස්ථාවේ දී පළාත් පාලන දෙපාර්තමේන්තුවේ උපදෙස් මත මේ ආකාරයෙන් ගිණුම්ගත කරමි. |
| (ඇ) | ණයහිමියන් හය දෙනෙකුට අදාල රු.392,151 ක් වැඩිපුර ගිණුම්ගතකර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | වත්තල හා මීගමුව අධිකරණ මගින් ලබාදුන් නඩු තීන්දු අනුව සභාවේ සේවක මහතෙකුට රු.164,254 ක සේවක වන්දි මුදලක් (අර්ථසාධක) ගෙවන ලෙස 2016 දී තීන්දුවී තිබූ අතර එම ගෙවීම සඳහා ප්‍රතිපාදන කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශන වල සටහනක් මගින් හෙළිදරව් කළයුතු වේ. | නඩු කටයුතු පිළිබඳව කටයුතු කරන සංවර්ධන නිලධාරී මහත්මියට හා ගිණුම් විෂය භාරව කටයුතු කරන සංවර්ධන නිලධාරී මහත්මියට නිසි දැනුවත්භාවයක් නොතිබීම නිසා මෙම නඩුව සම්බන්ධයෙන් අසම්භාව්‍ය බැරකම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට නොහැකි වී ඇති බව සඳහන් කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ගිණුම් විෂයයන් 03 ක ශේෂ එකතුව එම ගිණුම් විෂයයන්ට අදාල උප ලේඛන ශේෂ එකතුව සමග රු.8,273,239 ක වෙනසක් තිබුණි. | අදාළ ශේෂ වල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | එම ශේෂ නිවැරදි කිරීම කෙටි කාලයක් තුළ සිදුකිරීම අපහසු වී ඇත. එම ශේෂවල නොගැලපීම් වලට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමෙන් පසු විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය තුළ වර්ෂ 10 ට වැඩි රු.974,800 ක් හා වර්ෂ 1-3 අතර රු.1,257,282 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ණයහිමි ශේෂය වූ රු.155,144,953 ක් තුල වර්ෂ 3-5 අතර ශේෂය රු.64,774 ක්ද, වර්ෂ 1-3 අතර රු.2,901,962 ක්ද, වර්ෂයකට වඩා අඩු රු.152,178,217 ක්ද විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2016 වර්ෂයේ සිට කර්මාන්ත වෙනුවෙන් ලැබිය යුතු රු.420,833 ක මුදලක් 2019 මැයි 24 වන විටත් ලැබී නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.5 **අනුකූල නොවීම්**

1.5.1 **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| **නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 219 වගන්තිය | ප්‍රාදේශීය සභාවක කිසිම සභිකයෙකු හෝ සේවකයෙකුට ප්‍රාදේශීය සභාව සමග ඇතිකරන ලද යම් ගිවිසුමක හෝ වැඩයක හෝ මූල්‍ය සම්බන්ධතාවයක් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් නොතිබියයුතු වුවද, සභාවේ මන්ත්‍රීවරයෙකුගේ බිරිඳට උත්සවශාලාවක් බදුදී තිබූ අතර | නීතියට අනුකූලව කටයුතු කළයුතු වේ. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | 2009 මැයි 30 දින සිට රු.974,800 ක හිඟ බදුකුලී ශේෂයක් අයවිය යුතුව තිබුණි. | | |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | රු.2,385,615 ක ඉකුත් තැන්පතු පිළිබඳව කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

2. **මූල්‍ය සමාලෝචනය**

------------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.93,428,047 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.78,739,806 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

**---------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභා අරමුදල් ප්‍රදේශයේ ජනතාවට උපරිම ප්‍රතිලාභ ලැබිය හැකි පරිදි සැලසුම් සහගතව වැය කිරීම සභාවේ අරමුණ වුවද, සභාව සතු මුදල් රු.මිලියන 64.16 ක් ස්ථාවර තැන්පතු 20 ක ආයෝජනය කර තිබුණි. | අරමුදල් ප්‍රදේශයේ ජනතාවගේ සුහසිද්ධිය සඳහා යෙදවීමට කටයුතු කළයුතු වේ. | සභාවේ මූල්‍ය අස්ථාවර අවස්ථාවලදී එමගින් ඇතිවන අවදානම අවම කර ගැනීම සඳහා ස්ථාවර තැන්පතු වල මෙම මුදල ආයෝජනය කර ඇත. |

2.3 **ආදායම් පරිපාලනය**

**---------------------**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

**--------------------------------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 වර්ෂය ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | 2017 වර්ෂය ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 78,650,700 | 87,885,932 | 95,446,728 | 58,992,564 | 76,075,000 | 81,917,156 | 65,391,546 | 66,553,360 |
| බලපත්‍ර ගාස්තු | 2,700,000 | 2,160,330 | 2,160,330 | - | 2,450,000 | 2,756,085 | 2,756,085 | - |
| කුලී | 4,000,250 | 4,508,171 | 4,981,498 | 6,072,119 | 5,372,100 | 4,714,085 | 3,790,633 | 6,545,445 |
| වෙනත් ආදායම් | 148,821,550 | 183,357,043 | 183,357,043 | - | 140,986,800 | 134,672,205 | 134,672,205 | - |

## 2.3.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂය ආරම්භයේදී වූ රු.66,553,360 ක හිඟයෙන් සමාලෝචිත වර්ෂය තුළ අයකර ඇත්තේ සියයට 11.4 ක් තරම් ඉතා අඩු ප්‍රතිශතයක් විය. | හිඟ ආදායම් අයකරගැනීම කාර්යක්ෂමව සිදුකළයුතු වේ. | 2018 වර්ෂය තුල දී හිඟ අය කර ගැනීමේ කටයුතු වෙනුවෙන් දේපල තහනම් නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමට නොහැකි විය. එබැවින් හිඟ අයකර ගැනීමේ ප්‍රගතිය අවම වී ඇත. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 58.99 ක හිඟ වරිපනම් ශේෂය තුළ වසර 10 ට වැඩි රු.මිලියන 8.6 ක්ද, වසර 5-10 අතර රු.11.67 ක්ද, වසර 3-5 අතර රු.මිලියන 7.22 ක්ද, වසර 1-3 අතර රු.මිලියන 18.77 ක් හා වසරකට අඩු රු.මිලියන 12.69 ක්ද වශයෙන් හිඟ ශේෂ පැවතුණි. | හිඟ ආදායම් අයකරගැනීම කාර්යක්ෂමව සිදුකළයුතු වේ. | |

## 2.3.3 කඩ කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හැඳල උප කාර්යාලයට අයත් කෙරවලපිටිය කඩ කාමර 24 කින් 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අයවිය යුතු රු.6,037,068 ක කඩ කුලිය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | හිඟ කඩකුලී අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

2.3.4 **වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේ ප්‍රචාරණ දැන්වීම් 174 කින් රු.573,310 ක ආදායමක් උපයා තිබුණද, 2015 දෙසැම්බර් 28 දින අංක 1947/6 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ ඇතුලත් අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව අයදුම්පත් සකස්කර නොතිබුණි. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම හෝ වැළඳ ගැනීම සිදුකළයුතු වේ. | අතුරු ව්‍යවස්ථාවට අනුව අයදුම්පත් සකස් කිරීමට හා දැන්වීම් පුවරු පිළිබඳව සමීක්ෂණයක් සිදුකරන ලෙසට ආදායම් පරීක්ෂකවරුන්ට උපදෙස් ලබා දී ඇත. |
| (ආ) සභා බල ප්‍රදේශය තුළ කුළුණු 28 කින් රු.489,801 ක වරිපනම් ආදායම පමණක් අයකර තිබූ අතර ව්‍යාපාර බදු අයකර නොතිබුණි. | ව්‍යාපාර බදු අයකළයුතු වේ. | 2020 වර්ෂයේ සිට ව්‍යාපාර බදු අයකරන ලෙස ආදායම් පරීක්ෂකවරුන්ට උපදෙස් ලබා දී ඇත. |
| (ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන 150 ක් බල ප්‍රදේශයේ තිබුණද බලපත්‍ර ලබාගෙන තිබුණේ 21 කි. එම පරිසර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා 2018 වර්ෂයේ වෙළඳ බලපත්‍ර ලබාදී තිබුණි. | පරිසර බලපත්‍ර ලබාගතයුතු සියළුම ආයතන වලට ගැසට් පත්‍රයේ විධිවිධාන වලට අනුකූලව බලපත්‍ර ලබාදිය යුතු වේ. | හඳුනාගත් ආයතන සඳහා බලපත්‍ර ලබා දීම සිදුකර ඇත. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 14 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවියයුතු වුවත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 07 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබුණි. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගතයුතු වේ. | ඉතිරි අතුරු ව්‍යවස්ථා 07 ක් පදනම් කරගෙන ඉදිරියේ දී ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |

(ආ) **අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) ලබානොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුස්තකාල ස්වයංක්‍රියකරණය සඳහා 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ රු.ලක්ෂ 06 ක මුදලක් වෙන්කර තිබුණද ඇනවුම් කළපසු නැවත මිල ගණන් සංශෝධනය වීම නිසා අපේක්ෂිත නිමවුම අත්පත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | අපේක්ෂිත නිමවුම් මට්ටම් සාක්ෂාත් කරගත යුතු වේ. | අපේක්ෂිත නිමවුම් මට්මම අත්පත් කර ගැනීමට නොහැකි වී තිබුණද මේ වන විට මිල ගණන් කැදවා අදාල කාර්යය ආරම්භ කර ඇත. |

(ඇ) **අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබානොගැනීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | හැඳල උප කාර්යාලයට අයත් කඩ කාමර 04 ක් 2007 වර්ෂයේ සිටද, 01 ක් 2013 වර්ෂයේ සිටද, 02 ක් 2016 වර්ෂයේ සිටද, 01 ක් 2017 වර්ෂයේ සිටද අපේක්ෂිත ප්‍රතිලාභ අත්පත් කරගැනීමකින් තොරව පැවතුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ අත්පත් කරගත යුතු වේ. | මෙම කඩ කාමර සභාවේ ප්‍රයෝජනය සඳහා යොදා ගෙන ඇත. |
| (ii) | රු.2,316,697ක් වටිනාකමැති රූඩ් 02 පර්චස් 11 ක හැඳල සෝසාතක ස්ථානය පිහිටි ඉඩමේ 2014 වර්ෂයේ රු. ලක්ෂ 20 ක් වැයකරමින් ගොඩනැගිල්ලක්ද සාදා තිබූ අතර 2014 වර්ෂයේ සිටම එම ඉඩමෙන් හෝ ගොඩනැගිල්ලෙන් අපේක්ෂිත ප්‍රතිලාභ කිසිවක් අත්පත් කරගෙන නොතිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ අත්පත් කරගතයුතු වේ. | බස් නැවතුමක් ලෙස මෙම ස්ථානයේ ගොඩනැගිල්ල පළාත් සභා අරමුදල් යටතේ ඉදි කර ඇත. ඇතැම් බස් රියදුරන් මෙම ස්ථානයට බස් රථ රැගෙනයාම සිදු නොකර ඇලකන්ද මංසංදියේ තම බස්රථ නවතා තබයි. |

(ඇ) **සන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 ජුලි 30 දින අංක 1560/6 දරන ගැසට් පත්‍රයේ 18(1) පරිදි වාර්ෂික අයවැය ලේඛනයේ කසළ දොරින් දොරට එකතු කිරීමේ වියදම් පියවා ගැනීම සඳහා ගාස්තු නියමකර නොතිබූ අතර 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/8 දරන ගැසට්පත්‍රය ප්‍රකාරව කසළ බදු හෝ ගාස්තු පනවා නොතිබුණි. සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳව අධීක්ෂණ කමිටුද පත්කර නොතිබුණි. | කසළ බදු හෝ ගාස්තු පනවා ගතයුතු වේ. | 2008 පෙබරවාරි 01 වන දිනැති අංක 1534/8 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව කසල බදු අයකිරීම පිළිබඳව මහා සභාවට යොමුකර අනුමැතිය ලබා ඇති අතර ගාස්තු අය කිරීමේ කටයුතු 2020 සිට සිදුකිරීමට අපේක්ෂිතය. |

3.2 **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වසරේ සිට කළමනාකරණ සහකාර තනතුරු 02 ක් ද, 2013 සිට පුස්තකාලාධිපති තනතුරක්, ආදායම් පරීක්ෂක තනතුරු 03 ක් හා පෙර පාසැල් ගුරු තනතුරක් පුරප්පාඩුව තිබුණි. | සේවක පුරප්පාඩු පුරවා ගතයුතු වේ. | මෙම තනතුරු පුරප්පාඩු බව සෑම කාර්තු වාර්තාවකින්ම දන්වා ඇත. |
| (ආ) | 2014 දෙසැම්බර් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 පරිදි ප්‍රාථමික සේවා ගණයේ සෞඛ්‍ය කම්කරු 12 ක් හා වැඩ ක්ෂේත්‍ර කම්කරු 35 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබාදී තිබුණද උක්ත චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තාකර අනුමත කාර්යය මණ්ඩලයට ඇතුලත් කරගෙන නොතිබුණි. | අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කළයුතු වේ. | සෑම කාර්තු වාර්තාවකින් ම දන්වා ඇත. නමුත් මේ දක්වා අනුමත කාර්යය මණ්ඩලයට ඇතුලත් කර නැත. |
| (ඇ) | රාජ්‍ය සේවා අර්ථසාධක පදනම මත තනතුරු ලැබූ සෞඛ්‍ය කම්කරුවන් 09 දෙනෙකු හා වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් දෙදෙනෙකු බඳවාගත් ස්ථිර තනතුරේ නොයොදවා සභාවේ ට්‍රැක්ටර් හා ලොරි රථ වල රියදුරන් ලෙස යොදවා තිබුණි. | බඳවාගත් ස්ථිර තනතුරේ රාජකාරි සඳහා යෙදවියයුතු වේ. | රියදුරු බලපත්‍රය සහිත කම්කරුවන් අදාල වාහන වල රියදුරන් වශයෙන් තාවකාලිකව යොදවාගෙන ඇත. |
| (ඈ) | සේවකයින් 34 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ වැටුප් රහිත නිවාඩු දින 804 ක් ලබාගෙන තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති මුදල රු.467,231 ක් විය. | වැටුප් රහිත නිවාඩු අවම කරගත යුතු වේ. | අදාල සේවකයන්ගේ ඊළග මස වැටුපෙන් එම වැටුප් රහිත නිවාඩු අඩු කරනු ලබයි. |

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------**

(අ) **<u>වරිපනම් / දේපල තක්සේරු කාලානුරූපීයව සිදු නොකිරීම.</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | -------------- | ------------------------------------- |
| සභාවට අයත් උප කාර්යාල තුනෙහිම වරිපනම් දේපල 2008 වර්ෂයේ තක්සේරු කර වර්ෂ 10 ක් ගතවී තිබුණු බැවින් දේපල වල වර්තමාන අගය පදනම් කරගෙන තක්සේරු ප්‍රතිශෝධනයක් සිදුකර ගැනීමට සභාව අපොහොසත් වීම නිසා බල ප්‍රදේශයේ දේපළ ඒකක 62,129 කින් අයකලහැකි යාවත්කාලීන බදු ප්‍රමාණය අයකරගත නොහැකිවී තිබුණි. | වරිපනම් දේපල තක්සේරුව නොපමාව කරගතයුතු වේ. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් 2015 වර්ෂයේ සිට ඉල්ලීම් කර ඇත. |
| (ආ) **<u>ඉඩම් විකුණුම් මත බදු</u>**<br>හැඳල උප කාර්යාලයට අයත් ඉඩම් 04 ක් විකිණීමෙන් ලද සියයට 1 බදු මුදල රු.1,781,115 ක් විය. එම මුදල ඉඩම් විකුණුම් අගය වෙනුවට සභාවේ නිලධාරියෙකුගේ තක්සේරුව පදනම් කර තිබුණි. | විකුණුම් අගය මත බදු අයකළයුතු වේ. | මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර ඉඩම් විකිනීමේ දී විකුණුම් අගය මත මෙම සියයට 1 බදු මුදල අය කිරීමට ආදායම් පරීක්ෂකවරුන්ට උපදෙස් ලබා දී ඇත. |

3.4 **වත්කම් කළමනාකරණය**

**---------------------------**

3.4.1 **වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

**-------------------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ---------------- | --------------------------------------------- |
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සභාව සතුව ඉඩම් 146 ක් තිබුණු අතර එම ඉඩම් වලින් 71 කට හිමිකම් ඔප්පු සහ ඉඩම් 51 කට පිඹුරුපත් නොතිබුණි. | සියළු ඉඩම් සඳහා ඔප්පු හා පිඹුරුපත් සකස් කළයුතු වේ. | ඉඩම් 34 සඳහා පිඹුරුපත් සකස් කිරීමට අවශ්‍යය සහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍යය කටයුතු සිදු කරන අතර එම කටයුතු අවසන් වු වහාම අදාල ඉඩම් සඳහා ප්‍රකාශන ඔප්පු සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

3.4.2 **පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර ඇති රු.24,361,461 ක් වටිනා කෘ කැබ් රථයක්, බැකෝ ලෝඩරයක් හා ගලි බවුසරයක අයිතිය පවරාගෙන නොතිබුණි. | වත්කම් පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග ලෙස ලද මෙම වාහන 2019 වර්ෂය තුල සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |

3.4.3 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන 06 අබලි/ගර්හිත තත්වයෙන් හැඳල හා වැලිසර වාහන අංගනයන්හි ඌන උපයෝජිතව තිබුණි. | අළුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම කළයුතු වේ. | අබලි හා ගර්හිත තත්වයේ පවතින මෙම වාහන සඳහා ඉංජිනේරු වාර්තාවක් ලබාගැනීමෙන් අනතුරුව අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන්නේ නම් විධිමත්ව අපහරණය කිරීමට කටයුතු කරමි. |

3.4.4 **වත්කම් අන්සතු කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වත්තල ප්‍රාදේශීය සභාවට පිරිනමන ලද රු.188,000 ක් වූ අක්කර 11 රූඩ් 02 පර්චස් 11 ක් විශාල උස්වැටකෙයියාව පාර්ස් වත්ත ඉඩම, සභාපති හා ලේකම් විසින් 1991 වර්ෂයේදී ඉඩම් කොටස් 57 ක් හෝ ඊට ආසන්න සංඛ්‍යාවකට බෙදා තෑගි ඔප්පු මගින් ඉඩම අන්සතුකර තිබුණි. | වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා ගැනීමට කටයුතු කළයුතු වේ. | තොරතුරු සොයා ගැනීම සඳහා අවශ්‍ය ලේඛන හෝ පුද්ගලයින් මේ වන විට සොයා ගත නොහැක. |

3.5 **ප්‍රසම්පාදනය**

3.5.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන ඒජන්සි චක්‍රලේඛ අංක | චක්‍රලේඛය පරිදි ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු වේ. | 2018 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලස්මක් සකස් කර ඇත. |

8 හි 4.2.1 (b) හා (c) පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික විස්තරාත්මක සැලැස්ම පිළියෙලකර නොතිබුණි.

3.5.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අපේක්ෂිත සම්පීඩන ශක්තිය පිළිබඳව රසායනාගාර පරීක්ෂාවකින් තහවුරු කර ගැනීමකින් තොරව කොන්ක්‍රීට් මාර්ග ඉදිකිරීම් 30 ක් සඳහා රු.19,217,736 ක් ගෙවීම් සිදුකර තිබුණි. | ප්‍රමිතිය විද්‍යානුකූලව තහවුරු කරගත යුතු වේ. | ව්‍යාපෘතිවලින් අව්ච්ඡේද ව්‍යාපෘති 03 ක් ඇත. ඉන් 02 ක වැඩ අවසන් කර ඇත. ඉතිරි ව්‍යාපෘතියේ වැඩ ඉදිරියේදී අවසන් කරනු ඇත. |